# ප්‍රවාහන වැරදි සම්බන්ධයෙන් අප කටයුතු කරන්නේ කෙසේද

බලය ලත් නිලධාරීහු දුම්රිය. ට්‍රෑම් හා බස්වල ගමන් කරති. සියලු දෙනා සිය ගමන් ගාස්තු ගෙවන බවත් පොදු ප්‍රවාහන සේවා මනාව පවත්වා ගැනීමට උපකාර කරන බවත් තහවුරු කර ගැනීම සඳහා ඔවුහු කැප වී සිටිති.

**ඔවුන්ට කළ හැකි දේ :**

- ඔබ බැස ගිය පසු පවා ඔබේ ටිකට්පත හා සහන හිමිකම් පරීක්ෂා කිරීමට
- සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට ඔබේ ටිකට්පත ඉල්ලා සිටීමට
- ඔබේ නම, ලිපිනය හා අනන්‍යතාව තහවුරු කිරීමට ඉල්ලා සිටීමට
- ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඔබ ගැන පැමිණිලි කිරීමට
- ඔබ අවනත වූයේ නැත්නම් පොලිසිය එනතෙක් ඔබට අත්අඩංගුවට ගැනීමට

**වලංගු ටිකට් පතක් නැතිව ගමන් කිරීම**

වලංගු ටිකට් පතක් නැතිව ගමන් කිරීමට අදාළ දඩ මෙසේ වේ :

**$248**
වැඩිහිටි

**$83**
ළමා

**එය සිදු වන්නේ කෙසේද :**

- බලය ලත් නිලධාරියකු ඉල්ලා සිටි විට ඔබ, ඔබේ ටිකට්පත (myki) හා අදාළ වේ නම් සහන කාඩ්පත ලබා දිය යුතුයි.
- මේවා වලංගු නැත්නම්, බලය ලත් නිලධාරියා විසින් ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත වාර්තාවක් යවනු ඇත.
- ඔබේ නම හා ලිපිනය ලබා දීම මෙන් ම අනන්‍යතාව තහවුරු කිරීම ද සිදු කළ යුතුය.
- බලය ලත් නිළධාරීහු අනතුරු ඇඟවීම් හෝ දඩ නිකුත් නොකරති. දෙපාර්තමේන්තුව විසින් බලය ලත් නිලධාරියාගේ වාර්තාව පරීක්ෂා කර බලා
  - දඩ
  - අනතුරු ඇඟවීම්
  - උසාවියට කැඳවීම්
  - ඉදිරි කටයුතු නොකිරීම සිදු කරයි.
- ඔබට දඩවලට එරෙහිව අභියාචනය කිරීමේ හැකියාව ඇත. ඔබේ අභියාචනය ප්‍රතික්ෂේප වුවහොත් ඔබට එක්කෝ දඩය ගෙවීමට නැත්නම් ඔබේ අභියාචනය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට සිදුවේ.

**වෙනත් ප්‍රවාහන වැරදි**

ව්‍යාජ නමක් ලබා දීම හෝ වැරදි ලිපිනයක් ලබා දීම හා අසභ්‍ය වචන භාවිත කිරීම නිසා දඩයක්, අනතුරු ඇඟවීමක් හෝ උසාවි කැඳවීමක් නිකුත් කළ හැකිය.

---

වැඩිදුර විස්තර සඳහා **ptv.vic.gov.au** වෙත යන්න. නැත්නම් **1800 800 007** අමතන්න.

ඔබට බිහිරි භාවය හෝ ඇසීමේ දෝෂයක් වේ නම්, වැඩිදුර විස්තර සඳහා ජාතික රිලේ සේවාව ඔස්සේ අප ඇමතීමට **relayservice.gov.au** වෙත යන්න.

වෙනත් භාෂාවලින් තොරතුරු ලබා ගැනීමට **ptv.vic.gov.au/languages** වෙත යන්නී නැත්නම් **9321 5450** අමතන්න.

---

VICTORIA State Government

STATE OF VICTORIA AUTHORISED DEPARTMENT OF TRANSPORT OFFICER

මෙම අත් පත්‍රිකාවේ දක්වා ඇත්තේ බලය ලත් නිලධාරීන් සතු යම් යම් බලතල පමණී 1983 ප්‍රවාහන (එකඟතා හා විවිධ) පනත (Transport (Compliance and Miscellaneous) Act 1983) යටතේ මේ බලතල ක්‍රියාත්මක වේ මෙම බලතල ක්‍රියාක්මක කිරීමේ දී ලබා ගන්නා 2014 තොරතුරු පෞද්ගලිකත්වය හා දත්ත සුරැකීමේ පනත (Privacy and Data Protection Act 2014) හා 1983 ප්‍රවාහන (එකඟතා හා විවිධ) පනත (Transport (Compliance and Miscellaneous) Act 1983) යටත් එක්රැස් කිරීම හා පවත්වා ගැනීම සිදුවනු ඇතී

PTVH4053/19. Authorised by Public Transport Victoria, 750 Collins Street, Docklands